# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 33 දරන කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 අගෝස්තු මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5 .00 යි.

## 2007 අංක 33 දරන කල්බදු මුල්‍යකරණ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 අගෝස්තු මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 64/2006

### 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 2007 අංක 33 දරන කල්බදු මුල්‍යකරණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 56 දරන පනතට 34අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. 2000 අංක 56 දරන කල්බදු මුල්‍යකරණ පනතේ 34 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතෙහි 34අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"ඇතැම් ලියාපදිංචි කරන ලද කල්බදු මුල්‍යකරණ ආයතනවලට ණය සාධන පත්‍ර නිකුත් කිරීම මගින් මුදල් ණයට ලබාගත හැකි බව.

34අ (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද—

(අ) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා විසින් කලින් කල නිකුත් කරන ලද දැන්වීමක් මගින් නිශ්චය කරනු ලබන මුදලකට වඩා අඩු නොවන ක්ෂය නොවූ ගෙවා නිම කළ සහ නිකුත් කරනු ලැබ ඇත්තාවූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලබන්නා වූ සහ මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පොදු සමාගමක් වන්නා වූ ලියාපදිංචි කරන ලද කල්බදු මුල්‍යකරණ ආයතනයකට, යම් ණය සාධන පත්‍ර නිකුත් කිරීම මගින්; හෝ

(ආ) (අ) වන ඡේදය යටතේ නිකුත් කරන ලද නිවේදනයේ නිශ්චිතව සඳහන් වූ මුදලට වඩා අඩු, ක්ෂය නොවූ ගෙවා නිම කළ සහ නිකුත් කරනු ලැබ ඇත්තාවූ ප්‍රාග්ධනයක් පවත්වාගෙන යනු ලබන්නා වූ සහ මේ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් පොදු සමාගමක් වන්නා වූ ලියාපදිංචි කරන ලද කල්බදු මුල්‍යකරණ ආයතනයකට, පෞද්ගලික පැවරීම් මගින්,

අධ්‍යක්ෂවරයාගේ අනුමතය ඇතිව, මුදල් ණයට ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

(2) තත්කාර්ය සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මගින් එම ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනය විසින් (1) වන උපවගන්තියේ කාර්යය සඳහා අධ්‍යක්ෂවරයාගේ අනුමතය ලබාගත යුතු අතර, එම අනුමතය අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්විය හැකිය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා—

"ණය සාධන පත්‍රය" යන්නෙන්, සෘණ පත්‍රයක්, බැඳුම්කරයක්, පොරොන්දු නෝට්ටුවක් හෝ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් යම් ණය සාධන පත්‍රයක් අදහස් වේ; සහ

"පෞද්ගලික පැවරීම" යන්නෙන්, සංස්ථා ප්‍රකාශයක් නිකුත් කිරීමකින් හෝ අන්තර්ජාලය, තැපැල, ෆැක්ස්, විද්‍යුත් තැපැල, පත්‍රිකා, බැනර්, පෝස්ටර් හෝ කුඩා පොත් හෝ කවර හෝ අයුරකින් සිදුකරනු ලබන යම් ආකාරයක ප්‍රචාරක වැඩ ඇතුළු ජනමාධ්‍ය හරහා කරනු ලබන ප්‍රකාශ කිරීමකින් හෝ තොරව, සෘණ සාධන පත්‍ර නිකුත් කිරීම අදහස් වේ.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.